රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
அரசாங்க நிர்வாக மற்றும் உள்நாட்டலுவல்கள் அமைச்சு
Ministry of Public Administration and Home Affairs

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07. சுதந்திர சதுக்கம், கொழும்பு 07. Independence Square, Colombo 07.

දුරකථන / தொலைபேசி / Telephone : (94) 011-2696211-13
ෆැක්ස් / பெக்ஸ் / Fax : (94) 011-2695279
ඊ-මේල් / இ-தபால் / E - mail : secretary@pubad.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Web Site : www.pubad.gov.lk

මගේ අංකය / எனது இல / My No : PA/CS/HR/16
ඔබේ අංකය / உமது இல / Your No :
දිනය / திகதி / Date : 2013.07.09

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,

දිස්ත්‍රික් ලේකම්වරුන්/දිසාපතිවරුන්,

දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත

**ඒකාබද්ධ සේවයේ 2013 වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මකවීමේ ප්‍රගතිය පරීක්ෂා කිරීම සහ නිළධාරීන්ගේ දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම**

2013 වාර්ෂික ස්ථාන මාරු ලැබ නව සේවා ස්ථානවලට වාර්තා නොකරන ලද ඒකාබද්ධ සේවයේ නිලධාරීන් පිළිබඳව විවිධ ආයතන ප්‍රධානීන්ගෙන් සහ නිලධාරීන්ගෙන් පැමිණිලි බොහොමයක් අප වෙත ලැබී ඇත. වාර්ෂික ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් අභියාචනා බලධාරියා වන රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතියකින් තොරව ස්ථාන මාරු නියෝග සංශෝධනය කල නොහැකි බැවින් ස්ථාන මාරු ලද නිලධාරීන් නව සේවා ස්ථාන වලට වාර්තා නොකිරීම නිසා එම සේවා ස්ථානවල රාජකාරී කටයුතු කර ගැනීමට දැඩි බාධාවක් ඇති වී ඇති අතර වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාවලියේ අවසන් ප්‍රතිඵල ඵලදායි ලෙස ක්‍රියාත්මක නොවන බව නිරීක්ෂණය වී තිබේ.

02. වාර්ෂික ස්ථාන මාරු නියෝග ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ඔබ සමඟ කඩිනමින් සාකච්ඡාවක් පැවැත්වීමට තීරණය කර ඇති බැවින් පහත සඳහන් තොරතුරු **2013.07.31** දිනට පෙර අප වෙත වාර්තා කරන මෙන් කාරුණිකව ඉල්ලමි.

- ඔබ ආයතනයේ සේවය කරන ඒකාබද්ධ සේවයට අයත් නිලධාරීන්ගේ තොරතුරු සහිත ලේඛනය (එක් එක් සේවාවන්ට අදාළව හා ප්‍රාදේශීය කාර්යාල මට්ටමින් වෙන් වශයෙන් ඇමුණුම 01 අනුව ලේඛන පිළියෙළ කල යුතුය).

- 2013 වාර්ෂික ස්ථාන මාරු නියෝග ලැබූ නිලධාරීන් පිළිබඳ ලේඛනය (එක් එක් සේවාවන් සඳහා වෙන් වෙන්ව ලේඛන පිළියෙළ කල යුතුයි. ඇමුණුම අංක 02)

03. කළමනාකරණ සහකාර සේවයට නව බඳවා ගැනීම් මගින් පුරප්පාඩු පිරවීමේදී ඉදිරිපත් කර ඇති තොරතුරු උපයෝගී කර ගනු ලබන බැවින් ඉහත විස්තර කඩිනමින් ලබා දීමට කටයුතු කරන මෙන්ද වැඩිදුරටත් ඉල්ලා සිටිමි.

කේ.වී.පී.එම්.ජේ.ගමගේ,

ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්.

**ඇමුණුම 1** **(එක් එක් සේවාවන් සඳහා වෙන වෙනම මෙම ආකෘතිය සම්පූර්ණ කරන්න)**
**(ප්‍රාදේශීය කාර්යාල මට්ටමින් තොරතුරු පිළියෙල කළ යුතුයි)**

## ඒකාබද්ධ සේවයට අයත් නිලධාරීන් පිළිබඳ විස්තර

කාර්යාලය : ................................................................

............................................ සේවය

| අනු අංකය | ලිපිගොණු අංකය | නම | ජාතික හැඳුනුම්පත් අංකය | මුල් පත්වීමේ දින සිට සේවා විස්තරය |
|---|---|---|---|---|
| | | | | |

.................................
දිනය

..........................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන හා නිල මුද්‍රාව

ඇමුණුම 2

# 2013 වාර්ෂික ස්ථාන මාරු නියෝග ලැබූ නිලධාරීන් පිළිබඳ විස්තර

................................................................. සේවය

| අනු අංකය | ලිපිගොණු අංකය | නම | ස්ථාන මාරු ලද සේවා ස්ථානය | ක්‍රියාත්මක වූ දිනය | අනුප්‍රාප්තිකයාගේ නම හා සේවයට වාර්තා කල දිනය | ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක නොවීමට හේතුව |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

.....................................................
දිනය

...........................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන හා නිල මුද්‍රාව